**මන්නාරම ප්‍රාදේශීය සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වුවද, ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2011 අප්‍රේල් 12 දිනදී වන අතර ඉකුත් වර්ෂයේ සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය ඉදිරිපත් කරන ලද්දේ 2010 අප්‍රේල් 20 දිනදීය.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මන්නාරම ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම්වල දැක්වෙන අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| | වියදම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 01 | 18,008 | 03 | 358,556 | 02 | 1,312,234 |

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

විගණනයට අවශ්‍ය තෙරෙතුරු නොමැතිවීම නිසා වටිනාකම රු.1,280,559 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.3 අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| **(i)** | **ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988** | | |
| (අ) | I වැනි පරිච්ඡේදයේ 05 වගන්තිය | - | මුදල් සහ ගබඩා විෂයයන් පරිහරණය කිරීමට අදාළ නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | III වැනි පරිච්ඡේදයේ 66 වගන්තිය | - | ලේකම්වරයා විසින් හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | III වැනි පරිච්ඡේදයේ 76 වගන්තිය | - | කුලී අයකර ගැනීමේ ප්‍රමාදයන් පැවතුනි. |
| (ඈ) | III වැනි පරිච්ඡේදයේ 81 වගන්තිය | - | එක් එක් කාර්තුව අවසානයේ මුද්දර ගාස්තු එකතු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | V වැනි පරිච්ඡේදයේ 140 වගන්තිය | - | රු.295,489 ක් වූ අත්තිකාරම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | VI වැනි පරිච්ඡේදයේ 145 වගන්තිය | - | උප ලෙජරය සහ ප්‍රධාන ලෙජරය සමඟ තැන්පතු ලෙජරය සසඳා නොතිබුණි. |
| (උ) | VII වැනි පරිච්ඡේදයේ 166වගන්තිය | - | ප්‍රධාන ලෙජරයහි සටහන් යෙදීම සඳහා ජර්නලයක් පවත්වා නොතිබුණි. |
| (ඌ) | IV වැනි පරිච්ඡේදයේ 169 වගන්තිය | - | වගකිවයුතු නිලධාරීන් වැඩකටයුතු වලට අදාලව පීඑස් 40,පීඑස් 41 සහ පීඑස් 42ලේඛණ පවත්වා නොතිබුණි. |
| (එ) | VIII වැනි පරිච්ඡේදයේ 178(7) | | රු.100,000 කට වැඩි කාර්යයන් සඳහා මිල කැඳවීම් |

| | | | |
|---|---|---|---|
| | වගන්තිය | | පරිපාටියට අනුව පුවත්පත් දෙකක දැන්වීම් ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ii) | උතුරු පළාත් මුදල් රෙගුලාසි අංක 237(iv) | - | මාස 06 කට වඩා ගතවූ වටිනාකම රු.8,000 ක මුදල් නොකළ චෙක්පත සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 437 | - | ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ රක්ෂණය කරනු වෙනුවට රජය සතු වාහන 4 ක් රු.5,694 කට පෞද්ගලික රක්ෂණ සමාගමක රක්ෂණය කර තිබුණි. |
| (iv) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(අ) වගන්තිය | - | විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය රහිතව වර්ෂයකට රු.1,000 කට වැඩි මුදලක් ආගමික සහ පොදු කටයුතු සඳහා වියදම් නොකළ යුතුය. නමුත් ආහාරපාන වෙනුවෙන් අවස්ථා 15 කදී රු.37,285 ක් වැය කර තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1.327,877 ක්වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.306,127 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 143 | 123 | 1,603 | 78 | 86 | 1,581 |
| කල්බදු කුලී | 1,736 | 1,929 | 867 | 769 | 1,061 | 867 |
| බලපත්‍ර ගාස්තු | 441 | 637 | - | 594 | 333 | - |
| වෙනත් ආදායම් | 16,753 | 19,194 | - | 684 | 369 | - |

### 2.2.2 උසාවි දඩ මුදල්

2010 වර්ෂය සඳහා උසාවි දඩ මුදල ලෙස අයවිය යුතු මුදල් ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 13,568 | 13,477 | 91 | 10,212 | 12,798 | (2,586) |
| වෙනත් වියදම් | 3,383 | 2,587 | 796 | 2,039 | 1,639 | 397 |
| උප එකතුව | 16,951 | 16,064 | 887 | 12,251 | 14,437 | (2,189) |
| ප්‍රාග්ධන වියදම් | 2,116 | 4,028 | (1,912) | 3,678 | 438 | 3,240 |
| මුළු එකතුව | 19,067 | 20,092 | (1,025) | 15,929 | 14,875 | 1,051 |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 සැප්තැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික මට්ටම | 02 | 01 |
| ද්විතීය මට්ටම | 13 | 14 |
| ප්‍රාථමික මට්ටම | 29 | 33 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | - |
| එකතුව | 44 | 48 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

එකතුව රු.2,448,543 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. සභාපතිවරයාගේ අදහස් දැක්වීම් අනුව මෙම හිඟ මුදල් අයකර ගත යුතු වූයේ යුද්ධය පැවති කාලපරිච්ඡේදයේ අවතැන් වූ පුද්ගලයන් ගෙනි.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය

මියගිය, ස්ථාන මාරු ලැබූ හෝ සේවය අතහැර ගියාසේ සලකන ලද නිලධාරීන්ට අදාළ වර්ෂ 02 කට අධික කාලයක් ගතවූ වටිනාකම රු.173,940 ක්වූ හිඟ සේවක ණය අයකරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.6 අරමුණුවලට පරිබාහිර වූ ක්‍රියාකරකම්

නීතිය මගින් සභාව වෙත පවරන ලද කාර්යභාරයන්ට පරිබාහිර වූ අරමුණු වෙනුවෙන් පහත සඳහන් වියදම් දරා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i.) උතුරු පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය විසින් පවත්වන ලද "සම්බෝසියම්" ප්‍රදර්ශනය සඳහා වරාය ආකෘතියක් පිළියෙල කිරීම සඳහා රු.80,885 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ප්‍රාදේශීය සභාවේ අරමුණුවලට පටහැනිව මෙම ගෙවීම සිදුකර තිබුණි.

(ii.) ප්‍රාදේශීය සභාව රු.69,300 ක් වටිනා සීලින් විදුලි පංකා 06 ක් මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය වෙත පරිත්‍යාග කර තිබුණි.

(iii.) සභාවේ අරමුණුවලට පටහැනිව, ප්‍රාදේශීය සභාව විසින් "ඔලි විලා" උත්සවය සඳහා රු.3,040ක් වැයකර තිබුණි.

(iv.) ආණ්ඩුකාරවරයා විසින් පුස්තකාල පොත් බෙදාදීමේ උත්සවයේ ආහාරපාන වියදම් වශයෙන් රු.10,939 ක මුදලක් වැයකර තිබුණි.

## 3. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත්

(ඊ) වාහන උපයෝජනය